# පඬුඅබා යක්ෂ නම් දෙවනපෑතිස් රට පාවාදුන් යක්ෂ ගෝත්‍රිකයෙක් ද?

කුමාරතුංග මුනිදාස මහතා පඬුඅබා කුමරුගේ පියා පිළිබඳව කුමක් කීව ද එය සැකයකින් තොරව පවසා නැත. එමෙන් ම ඒ මහතා සිංහල ජාතියේ සම්භවය පිළිබඳ දක්වා ඇති අදහස් සංගත ආකාරයකින් කියා නැත. පළමුවෙන් ම ඒ මහතාට හා හෙළ හවුළට අනුව සිංහල ජාතියේ සම්භවය පිළිබඳ අදහස් දෙකක් වෙයි. එකකට අනුව සිව් හෙළ සිහළ වී ඇත. අනෙක් මතයට අනුව සිංහයන් ලානය කළ හෙයින් ජාතිය සිංහල වී ඇත.

මේ මත දෙකින් ම අවසානයේ දී කියැවෙන්නේ සිංහ වාංශිකයන් නොමැතිව සිංහල ජාතිය ගොඩනගා ඇති බව ය. සිව් හෙළ යන්නෙහි සිංහල ජාතිය ගොඩනැගීමට දායක වූයේ ගෝත්‍ර හතරක් බව කියැවෙයි. ඒ ගෝත්‍ර හතර යක්ෂ නාග, දේව, රාක්ෂස බව අමුතුවෙන් කිවයුතු නො වෙයි. සිංහයන් ලානය පිළිබඳ කතාවෙහි සිංහල ජාතිය ගොඩනැගීමට දායක වූයේ කිනම් ගෝත්‍ර දැයි නොකියන නමුත් එයට සිංහ වාංශිකයන් නම් සහභාගි වී නැති බව පැහැදිළි ය.

දැන් ප්‍රශ්න කිහිපයක් වෙයි. පළමුවෙන් ම දඹදිවින් පැමිණි අනෙක් වාංශිකයන් හා ගෝත්‍රිකයන් ගැන කිසිවක් නොකියන්නේ ඇයි ද යන්න ය. දඹදිවින් අර්ධ වෛදිකයන් පැමිණ ඇත්තේ උපතිස්ස නුවර අවටට පමණක් නො වෙයි. ඔවුන් රුහුණු රටටත් පැමිණ ඇත. එසේ පැමිණියෝ සියල්ල සිංහ වාංශිකයෝ නො වූහ. ශාක්‍ය වාංශිකයන් හා වෙනත් අය ද දඹදිවින් ලංකාවට පැමිණ ඇති බව පැහැදිළි ය. සිංහල ජාතිය ගොඩනැගීමේ දී ඔවුන්ගේ දායකත්වයක් නො විණි ද? එසේ නොවුණත් ඔවුන්ට කුමක් වී ද? සිංහ වාංශිකයන් සමග ඔවුහු ද ඝාතනය කරනු ලැබුවෝ ද?

සිව් හෙළ සහ සිංහයන් ලානය කිරීම පිළිබඳ කතාවලින් ඒ කිසිවක් නො කියැවෙයි. ඒ ගෝත්‍රවලට හා වංශවලට අයත් වූයේ සුළු පිරිසක් කියා ප්‍රශ්නයෙන් ගැළවීම අපහසු ය. මේ ගෝත්‍රවලට හා වංශවලට අයත් වූවන් රුහුණේ රජ කර ඇති බැවින් ඔවුන්ට කුමක් සිදුවී ද යන්න දැනගැනීමට අවශ්‍ය වෙයි. පඬුඅබා රජු විසින් පිහිටුවනු ලැබූ එක්සේසත් රාජ්‍යයට රුහුණ අයත් නො වී ද? මේ පිළිබඳ හෙළ හවුළ කිසිවක් කියා ඇති බවක් දැනගන්නට නො මැත.

එහෙත් එයටත් වඩා ප්‍රශ්නය වන්නේ ඉතිහාසයේ කිසි දිනෙක කිසිවකු විසින්වත් සිව් හෙළ යන්න යොදාගනු නො ලැබීම ය. වංසකතාවෙහි හෝ වෙනත් තැනක හෝ සිව් හෙළ යන්න දක්නට නැත. අඩුම තරමින් දීපවංසයෙහිවත් එවැනි සඳහනක් නො වෙයි. සිව් හෙළ යන්න විකාශය වී සිංහල යන්න ඇතිවිණි නම් ඉතිහාසයේ යම්කිසි කලක සිංහල ජාතියට සිව් හෙළ යන්න යෙදිය යුතුව තිබිණි. එසේ නම් කොතැනක හෝ ඒ පිළිබඳ සඳහනක් විය යුතු ය.

එහෙත් මෙහි දී සිව් හෙළ ප්‍රවාදයට ගැලවීමක් නැතිවා නො වෙයි. ඒ ප්‍රවාදයේ ප්‍රචාරකයන්ට කිව හැක්කේ එලෙස සඳහන් ව තිබූ පොත පත පසුව විනාශ කෙරී ඇති බව ය. එවිට ප්‍රශ්නය වනුයේ ඒ පොත පත විනාශ කෙළේ කවුද යන්න ය. ඒ විනාශය පඬුඅබා රජු දවස හා වැඩිම තරමින් ගතහොත් දිපවංශය ලියූ කාලය අතර සිදු වී යැයි කිවහැකි ය. ඒ කාල පරිච්ඡේදයෙහි ලියූ පොත පත ගැන සඳහන් වන්නේ වී නමුදු ඒ පොත පතෙහි අන්තර්ගතය කුමක් වී ද යන්න දැනගැනීමට නැත.

පඬුඅබා රජු සිංහ වාංශිකයන් ලානය කර හෝ සිංහ වාංශිකයන් කොන්කර ඔවුන් සහභාගි නොකර ගනිමින් හෝ සිංහල ජාතිය පිහිටුවී යැයි ද ස්වදේශිකයන් යැයි කියනු ලබන යක්ෂ ගෝත්‍රිකයන් පඬු අබා රජු යටතේ රාජ්‍ය බලය ලබාගත්තේ යැයි ද සිතමු. ඔවුන් ලියූ පොත පතෙහි සිව් හෙළ යන්න සඳහන් වී යැයි ද සිතමු. එසේ නම් ඉන් කලකට පසු දීපවංසය ලියැවෙන්නට පෙර නැවතත් සිංහ වාංශිකයන් බලයට පත් වී අර පොත පත සියල්ල ගිනිබත් කර විජයගේ හා සිංහබාහුගේ කතාව පොත් පත්වල ලියා තබන්නට ඇත. නො එසේව සිංහල ජාතියේ සම්භවය සිංහ වාංශිකයන්ට ම හිමිවන අයුරින් වංසකතාවල සඳහන් වීමට හේතුවක් නැත.

එසේ නම් ඒ සිදු වූයේ කිනම් කලක ද? කිනම් රජු දවස ද? ඇතැමුන්ට අනුව ලම්බකර්ණ වාංශික රජවරු යක්ෂ ගෝත්‍රිකයෝ ය. සුභ සහ යස රජ දවස සිදුවූයේ සිංහ වංශයෙන් ලම්බකර්ණ වංශ්‍රයට රාජ්‍යත්වය මාරුවීම යැයි කියනු

© Prof. Nalin De Silva

ලැබෙයි. වසභ රජු ද ලම්බකර්ණ රජකු යැයි කියනු ලැබෙයි. සිංහ වංශයෙන්, එනම් වංසකතාවෙහි කියන අයුරින් මෞර්ය ගෝත්‍රයෙන්, ලම්බකර්ණ වංශයට රාජ්‍යත්වය මාරුවීම පිළිබඳවත් ඉන්පසු ධාතුසේන රජුගේ කාලයේ දී නැවත මෞර්ය වංශයට රාජ්‍යත්වය හිමිවීමත් ගැන සඳහන් වන නමුත් පඬුඅබා රජු දවස බලයට පත් වී යැයි කියන යක්ෂ ගෝත්‍රය පරදවා සිංහ වාංශිකයන් නැවත බලයට පත්වීමක් ගැන වංසකතාවෙහි සඳහන් නොවන්නේ ඇයි? මේ ප්‍රශ්නය කිහිප ආකාරයකින් වැදගත් වෙයි. ප්‍රශ්නයට දිය හැකි පිළිතුරු කවරේ දැයි ඒ අතර විමසා බලමු.

පඬුඅබා රජු කල යක්ෂ ගෝත්‍රිකයන් බලයට පත්වුව ද වංසකතාකරුවන් ඒ ලියා නොතැබූ හෙයින් නැවතත් සිංහ වාංශිකයන් බලයට පත්වූ කල එය ද ලියා තැබීමට නොහැකි වීය යන්න ඒ ප්‍රශ්නයට දිය හැකි පිළිතුරක් වෙයි. එහෙත් ඉතිහාසකරයෝ එසේ ඉතිහාසය නො ලියති. අනෙක් අතට වංසකතා යනු වංසකතාකරුවන්ගේ පමණක් කෘති නො වෙයි. වංසකතා ලියැවී ඇත්තේ ජනප්‍රවාද මෙන් ම එයට ඉහතින් ලියා ඇති පොත පත ද ආශ්‍රය කරමින් ය. මේ පොත් අද දකින්නට නොමැති බැවින් ඒ පොත්වලින් කුමක් ගත්තේ ද නොගත්තේ ද යන්න කිසිවකුටවත් නිශ්චිත ව කිවහැකි නො වෙයි.

වැඩිදුර යැමට පෙර ලම්බකර්ණ වාංශිකයන් යක්ෂ ගෝත්‍රිකයන් වේය යන මතය සාකච්ඡා කරමු. මේ මතයට අනුව මහසෙන් රජු ද ඔහුගේ පියා වූ ගෝඨාභය රජු ද සිරිසඟබෝ රජු ද යක්ෂ ගෝත්‍රයට අයත්වූහ. අනෙක් අතට ධාතුසේන රජු මෞර්ය ගෝත්‍රයට අයත් විය. මෞර්ය ගෝත්‍රිකයෝ යනු කවරහු ද? මහාවංසයෙහි සඳහන් ආකාරයට මෞර්ය ගෝත්‍රය යනු මෞර්ය අභිෂේකය සමග ඇරඹි රජ පෙළපතකි. මේ අන් කිසිවක් නොව දේවානම්පිය තිස්ස රජුගෙන් ඇරඹි රජ පෙළපත ය.

එහෙත් දේවානම්පිය තිස්ස රජු පඬුඅබා රජුගේ මුණුබුරා විය. අභිෂේකය වෙනස් වී යැයි ගත්ත ද, වංශය ලෙස ගතහොත් පඬුඅබා රජු හා දේවානම්පිය තිස්ස රජු එකම වංශයට අයත් වූහ. පඬුඅබා රජු යක්ෂ ගෝත්‍රයට අයත් නම් දේවානම්පිය තිස්ස රජු ද යක්ෂ ගෝත්‍රයට අයත් වෙයි. මෙහි දී පැන නගින ප්‍රශ්නයක් නම් යක්ෂ ගෝත්‍රයට අයත් දේවානම්පිය තිස්ස රජු දඹදිව අශෝක රජුගෙන් අභිෂේකය ලබා ගත්තේ ඇයි ද යන්න ය. යක්ෂ ගෝත්‍රිකයන් ස්වදේශිකයන් නම් දිවිහිමියෙන් ස්වදේශික උරුමය රැකගැනීමට කටයුතු කළ අය නම් යක්ෂ ගෝත්‍රික දේවානම්පිය තිස්ස රජු එසේ කෙළේ ඇයි?

දේවානම්පිය තිස්ස රජු සිංහ, ශාක්‍ය හා වෙනත් වංශ මිශ්‍ර වූ පඬුඅබා වැනි රජකු නම් මේ ප්‍රශ්නය ඇසීමට සිදු නො වෙයි. අප කල්පනා කරන අයුරින් මෙරටට අර්ධ වෛදිකයන් පැමිණීමට පෙර තිබූ චින්තනය හා අර්ධ වෛදිකයන්ගේ චින්තනය අතර එතරම් වෙනසක් නො වී ය. එවිට අර්ධ වෛදික චින්තනයෙහි බිහි වූ බුදු දහම මෙන් ම අර්ධ වෛදික අභිෂේකය ද ලබාගැනීම ප්‍රශ්නයක් නො වේ. ප්‍රශ්නය ඇත්තේ දේවානම්පි තිස්ස රජු යක්ෂ ගෝත්‍රයට අයත් නම් ය.

එහෙත් පඬියකුට වෙනත් අර්ථකථනයක් ද දියහැකි බව අපි දනිමු. පඬියා කියනු ඇත්තේ ඉතිහාසයේ ද්‍රෝහිකම කර ඇත්තේ දේවානම්පිය තිස්ස රජු බව ය. පඬුඅබා රජු මෙන් ම යක්ෂ ගෝත්‍රිකයකු වුව ද දේවානම්පිය තිස්ස රජු අශෝක රජුගේ යටත් රජකු ලෙස අභිෂේක වී බුදුදහම ද වැළඳ ගෙන ස්වදේශික යක්ෂ ගෝත්‍රය පාවා දුන් බව පඬියා ට කිවහැකි ය. වංසකතාවල ඒ පිළිබඳ කිසිවක් සඳහන් නොවන බව ද වංසකතාව ඒ සියල්ල වසං කර ඇති බව ද ඔහුට තවදුරටත් කිව හැකි ය.

එවිට පඬි ඉතිහාස කතාව ලියැවෙනු ඇත්තේ මෙසේ ය. චිත්තරාජ නම් යක්ෂ ගෝත්‍රික නායකයාගේ ලේ ධාතුව රැගත් පඬුඅබා කුමරු විදේශයෙන් පැමිණි විජය රජුගේ විජාතික නඩය පරදවා ස්වදේශික ගෝත්‍ර එක්කර සිංහල ජාතිය ඇරඹී ය. එහෙත් ඔහුගේ මුණුබුරු දේවානම්පිය තිස්ස රජු අර විජාතිකයන්ට නැවතත් යට වී ඔවුන්ගේ අභිෂේකය ද ආගම ද පිළිගෙන යක්ෂ ගෝත්‍රය හා ස්වදේශිකයන් පාවා දුන්නේ ය. මේ නම් පඬියන්ට නරක කතාවක් නො වේ. අවශ්‍ය නම් ඒ පාවා දීම නිවැරදි කෙරුණේ සුබ හා යස කාලයෙහි දී හා වසභ රජුගේ කාලයෙහි දී යැයි ද කිවහැකි ය.

© Prof. Nalin De Silva

පඬියන්ට එවිට සියල්ල දේවානම්පිය තිස්ස රජුට බැර කළ හැකි ය; අශෝක රජුට හා බුද්ධදහමට පාවාදීමේ වරද පැටවිය හැකි ය. අශොක රජුගේ ධර්ම අධිරාජ්‍යයකට අප යටත් වූ බව පැවසිය හැකි ය. සිංහලය පාලි බස නිසා දූෂණය වීමට පටන්ගත් බව කිව හැකි ය. දෙමළ ජාතිවාදීන් ද කියන්නේ එවැනි කතාවකි. ඔවුන්ට අනුව මිහිඳු මහා රහතන් වහන්සේ වැඩම කිරීමට පෙර මෙරට වාසය කළෝ ස්වදේශික දෙමළ ජනයා ය. මිහිඳු හිමියන්ගෙන් පසු පිරිසක් බුද්ධදහම වැළඳ ගෙන පාලි භාෂාව යොදාගැනීමට පටන්ගත්හ. එහි ප්‍රතිඵලයක් වූයේ දෙමළ බස පාලිකරණයෙන් සිංහල නමින් භාෂාවක් නිර්මාණය වීම ය. මේ කුමාරතුංග මුනිදාස මහතා කියූ මතයට පටහැණි වෙයි. කුමාරතුංග මහතාට අනුව පාලි බස මෙරට නිර්මාණය කෙරුණු ලැබූ භාෂාවකි. එහෙත් දෙමළ ජාතිවාදීන්ට අනුව පාලි හා දෙමළ බස් මුසු වීමෙන් සිංහල භාෂාව නිර්මාණය වී ඇත.

දෙමළ ජාතිවාදය ද පඬියා ද අවසාන වශයෙන් පහර දෙන්නේ අප සියළු දෙන ම පෙළන බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ යටත්විජිතවාදයට නොව සිංහල බෞද්ධ රාජ්‍යයට ය. ඔවුන්ට ප්‍රශ්නය වන්නේ සිංහලයන් බෞද්ධ වීම ය. බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයට ද ප්‍රශ්නයක් වී ඇත්තේ බුද්ධදහම ය. ඔවුන් තැත්කරන්නේ බුද්ධදහම වැළඳ ගෙන දේවානම්පිය තිස්ස රජු අශෝක අධිරාජයේ යටත් රජකු වූ බව පෙන්වීමට ය. ඇතැම් පඬියන් දැනටමත් ඒ මතය ප්‍රකාශ කර ඇති බව අමතක නොකළ යුතු ය. එහෙත් පඬියන්ට වරදින්නේ ද මේ යටත්විජිතභාවය පෙන්නුම් කිරීමට යෑමේ දී ය. ඒ යටත්විජිතයක් නම් දේවානම්පිය තිස්ස රජුගෙන් හා අශෝක රජුගෙන් පසු එයට සිද්ධවූයේ කුමක් ද යන්න ප්‍රශ්නයකි. ඉන්පසු යටත්විජිතය නිදහස් වී ද? එසේත් නැත්නම් කාලයකට පසුව කිසියම් සිංහල රජ කෙනකු ලංකාවට නිදහස දිනා ගත්තේ ද? එසේ දිනා ගත්තේ නම් ඒ කිනම් වකවානුවක ද? ඒ නිදහස දිනාගැනීමක් පිළිබඳ ව කිසිම සඳහනක් නැත්තේ ඇයි? එසේ නිදහස දිනා නොගත්තේ නම් අප තවමත් දඹදිව යම්කිසි රාජ්‍යයක යටත්විජිතයක් ද?

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva